


14වන කොටස

රාත්‍රියේ නිහඬතාවට බාධා කරමින් තුරු පත් මතට පිනි බිඳු වැටෙන සියුම් රාවය නිදිවර්ජිතව සිටි නිමන්තට හොඳින් ඇසුණි. මේ රාත්‍රියේ මැදියම් යාමය වන්නට ඇතැයි ඔහු අනුමාන කළේ ය.

නිමන්ත නැගිට ගොස් මේසය මත වූ වතුර වීදුරුවෙන් අඩක්ම එක හුස්මට බීවේ ය. වතුර වීදුරුව අසළින්ම තිබූ අත් ඔරලෝසුව වේලාව රාත්‍රී එක බව දක්වයි. අමන්දි අද නොපැමිණෙන බව ස්ථිර ය. ඔහු නැවත පැමිණ ඇඳේ වැතිරුණේ ය.

උදෑසන අමන්දි පිටවගියේ කීයටදැයි ඔහු නොදත්තේ ය. ඇය පෙරදා රැයේ සිය සිත්තර ආම්පන්න ලකලෑස්ති කරමින් සිටිනු ඔහු දුටුවේ ය. එනිසා ඇගේ ගමන ඒ හා සම්බන්ධ කටයුත්තකට විය යුතු බව ඔහු සිතුවේ ය. යන්නට ඇත්තේ විශ්ව සමගින් බව නිසැක ය.

විශ්ව සමගින් අමන්දි රැයක් පිටත ගත කරන්නේ ය යන හැඟීම විසින් ජනිත කරන ලද ඊර්ෂ්‍යාවේ ඡායාවක් සැණෙකින් ඔහු සිත මත ඇඳී මැකී ගියේ ය. තමන්ගේ ජීවිතයෙන් බැහැරව ගිය ගැහැණියක වෙනුවෙන් ඊර්ෂ්‍යා කිරීමේ තේරුමක් නැති බව ඒ සැණින් ඔහු සිතුවේ ය. බැඳීම් රැඳී ඇත්තේ කඩදාසි කොල මත නොවන බව ඔහු දනියි. කඩදාසි කොලයක් මත අත්සන් තබා ඇති කරගත් ව්‍යාජයට වඩා අධ්‍යාත්මික බන්ධනයක් දැඩි විය යුතු ය. තමාත් අමන්දිත් අතර එවන් දැඩි අධයාත්මික බන්ධනයක් වීද යන්න ගැන දැන් නිමන්තට සැක සිතෙයි. එක ගෙදරක එකට කා බී ජීවත් වූ පමණින් අධ්‍යාත්මික බැඳීමක් ඇති විය නොහැකි බව ඔහු දනියි. අමන්දි මේ තරම් පහසුවෙන් තම ජීවිතයෙන් ඈත්ව ගියේ ඒ නිසා විය යුතු ය. එය

*<u>බැඳීම් රැඳී ඇත්තේ කඩදාසි කොල මත නොවන බව ඔහු දනියි. කඩදාසි කොලයක් මත අත්සන් තබා ඇති කරගත් ව්‍යාජයට වඩා අධ්‍යාත්මික බන්ධනයක් දැඩි විය යුතු ය.</u>*

අදහාගත නොහැකි තරම් පරිවර්තනයක් නොවේ ද?

නිමන්ත ඇඳේ දකුණුපසින් වූ කොට්ටය ගෙන සිය නළල මත තබා ගත්තේ ය. එහි තවමත් රැඳී ඇත්තේ අමන්දිගේ සුවඳයි. අමන්දි තමා වෙතින් ඈත්ව ගිය පමණින් ඇය අමතක කළ හැකිදැයි ඔහු තමාගෙන්ම ප්‍රශ්න කර ගත්තේ ය. ඔහු සුසුමක් හෙළා සිත සැහැල්ලු කරගන්නට උත්සාහ කළේ ය. අමන්දි

*<u>හුගක් මිනිස්සුන්ට තමන්ගෙ ගෑනිගෙ වටිනාකම තේරෙන්නෙ ඒ ගෑනි තමන්ට අහිමි වෙනකොට විතරයි.. ඒත් මං එහෙම මිනිහෙක් නෙවෙයි..</u>*

ඉක්මණින් මේ සියල්ල අතහැර යනු ඇත. මේ කෙටි කාලය ඇයට ඇගේ ජීවිතය ගෙවන්නට ඇගේ ජීවිතය විඳින්නට ඉඩ දිය යුතු ය. ඇයට ආදරය කරන්නේ නම් තමා පැතිය යුත්තේ ඇගේ සැනසීම පමණක්ම නොවේ ද? ආත්මාර්ථයට යට වී ඈ බලහත්කාරයෙන් සිරකරගන්නට තරම් පහත් මානසිකත්වයක් ඇති කරගන්නට තමාට නොහැකි බව නිමන්ත දනියි. කිසිවකුට අදහාගන්නට නොහැකි වුවද කිසිවකු අනුමත නොකළ ද ඒ සත්‍යයට ඉඩ දෙන්නට තමාට හැකි බව නිමන්ත දැන සිටියේ ය.

"හුගක් මිනිස්සුන්ට තමන්ගෙ ගෑනිගෙ වටිනාකම තේරෙන්නෙ ඒ ගෑනි තමන්ට අහිමි වෙනකොට විතරයි.. ඒත් මං එහෙම මිනිහෙක් නෙවෙයි.. අමා මට නැතිවුණත් එයා මා ළඟ හිටියත් හැම මොහොතකම මට එයාගෙ වටිනාකම තේරුණා.. ඒත් විශ්ව ඒ හැඟීමට යටවෙලා එයාගෙ මේ අවසාන මොහොතෙ එයා ලබන මේ සීමිත සැනසිල්ල විනාශ කරදාන්න මං උත්සාහ කරන්නෙ නැහැ.." විශ්ව හමුවූ අවසන් දවසේ තමා කියූ වදන් නිමන්ත නැවතත් සිතින් මිමිණුවේ ය. ඒ අදහස් මතම පිහිටා ජීවිතය මුහුණ දෙන්නට අවශ්‍ය ශක්තිය එක්තැන් කර ගත යුතුය.

0000000000000

විශ්වජිත් දකිමින් සිටියේ බියකරු සිහිනයකි. ඒ සිහිනයේ අමන්දිත් තමාත් සිටි බව ඔහුට මතක ය. සිදුවීම් සියල්ල පිළිවෙළින් එකලස් කරගත නොහැකි වුව ද අගාධයට ඇදී යමින් සිටි අමන්දි ගළවා ගන්නට තමාට නොහැක වූ බවත් තමා ඇගේ නම කියමින් කෑ ගසමින් සිටි බවත් පමණක් ඔහුට මතක ය. ඒ නිමේෂයේදී දැනුණ වේදනාවත් පසුතැවීමත් වරදකාරී හැඟීමත් නින්දෙන් පිබිදුණ මොහොතේත් ඔහුට දැනෙමින් තිබුණි.

ජනේලයේ වීදුරුව තුළින් නැවුම් හිරු රැස් කාමරයට ඇදී එයි. විශ්වජිත් ඇඳෙන් නැගිට ජනේල් පියන් විවෘත කළේ ය. එසැණින් කාමරයට ගලා ආ තෙත සීත සුළං රැල්ල ඔහු මහත් ආශ්වාදයකින් විඳ ගත්තේ ය. දිය පහරේ ගීතය දැන් නැවතත් හොඳින් ඇසෙයි. අද සුන්දර දවසක් විය යුතු ය.

ඔහු ඉක්මණින් මුහුණ දොවා ගත්තේ ය. වෙනදා උදෑසන කරන බාවනාව අද දිනට පමණක් අතහරින්නට ඔහු සිතවේ ය.

විශ්ව අමන්දි ගේ කාමරයට යන විට ඈ සිටියේ පෙර දිනයේ ඇඳි සිත්තම නිමා කරමින් ය. ඔහු දුටු සැණින් ඇගේ මුහුණේ විකසිත වූ සිනාව ඔහු සිත ප්‍රබෝධයට පත් කළේ ය.

"හොඳට නිදා ගත්ත ද..?" ඔහු ඇසූ පළමු පැනය එය විය.

"ඔව්.. සනීපෙට නින්ද ගියා.. උදෙන්ම ඇහැරුණා.. ඉතින් මං කම්මැලිකමටත් එක්ක පේන්ටිං එකේ වැඩ කරන්න ගත්තා.." අමන්දි සිනා සී කීවා ය. ඔහු ඇය අසළට පැමිණ ඇගේ උරහිසට උඩින් සිත්තමට එබී බැලුවේ ය. තමා සිත්තමට අලුතින් එක් කළ ගස ඔහු දකින්නට ඇති බව ඇයට නිසැකය. දඟකාර ලෙස හිස හරවා ඔහු දෙස

